# <u>පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

**AAT/ 140/2023 (PSC)**

ආර්.ඩබ්.ඩබ්.යූ.ඩී.සම්පායෝ

**අභියාචක**

**එදිරිව**

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**වගඋත්තරකරු**

**දිනය :-2025.05.28**

| | | |
|---|---|---|
| ඉදිරියේ දී :- | විනිසුරු කේ.ටී.චිත්‍රසිරි | (සභාපති) |
| | ජේ.ජේ.රත්නසිරි | (සාමාජික) |
| | එස්.නන්දසේකරන් | (සාමාජික) |

පෙනී සිටීම :- අභියාචක වෙනුවෙන් නීතිඥ හිරන්‍යා දමුණුපොල මිය සමඟ නිතිඥ ශාන්ත ජයවර්ධන මහතා,
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් පවනි රශ්මිකා මිය.

**විනිසුරු කේ.ටී.චිත්‍රසිරි මැතිතුමා**

**-<u>නියෝගය</u>-**

මෙම නඩුවේ අභියාචක වන ආර්.ඩබ්.ඩබ්.යූ.ඩී.සම්පායෝ විසින් 2023.07.19 වෙනි දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනය මඟින් පහත සඳහන් සහන ඉල්ලා ඇත.

“අ. **මා හට නිකුත් කරන ලද 2020.10.28 දිනැති චෝදනා පත්‍රයේ I සිට VI දක්වා සියළු චෝදනාවන්ගේ මා වරදකරු කරමින් ගෙන ඇති තීරණය ඉවත් කරන ලෙසත්,**

ආ. **මා නිල තත්ත්වයෙන් එක් පියවරක් පහළ තනතුරට යැවීමට ඇති දඬුවම ඉවත් කරන ලෙසත්,**

ඇ. **මාගේ වැටුප් වර්ධක 6 විලම්භනය කිරීමට පනවා ඇති දඬුවම ඉවත් කරන ලෙසත්,**

**ඈ. මා හට නිකුත් කරන ලද 2020.10.28 දිනැතිව I සිට VI දක්වා චෝදනා පත්‍රයේ සියලු චෝදනා වලින් නිදොස් කොට නිදහස් කරන ලෙස ඉල්ලා සිටිමි.**

ඉහත සඳහන් සහනයන්ට අමතරව,

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023.07.04 වන දිනැතිව ගනු ලැබ ඇති තීරණය සම්බන්ධයෙන් පහත සහනද ලබා දෙන ලෙසටත් අභියාචක විසින් ඉල්ලා ඇත. ඒවා නම්,

**ඉ. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2023.07.04 වන දිනැති ගෙන ඇති තීරණය ඉවත් කරන ලෙසත්, වැඩ තහනමට අයත් කාලය සඳහා හිඟ වැටුප් ගෙවීමේ පිළිබඳ තීරණය ලැබීමෙන් පසු සළකා බැලීමට ඇති තීරණය ඉවත් කරන ලෙසත්,**

**උ. මා නැවත සේවයේ පිහිටවන ලෙසත්.**

**ඌ. වැඩ තහනමට ලක් වු කාලය සඳහා හිඟ වැටුප් ලබා දෙන ලෙසටත් නියෝග කරන ලෙසටත් ය.”**

එකී සහන අතුරින් ඉ, උ, ඌ දරණ අවසාන සහන තුන සම්බන්ධයෙන් දැනටමත් තීරණයන්ට එළඹ ඇති නිසා, මේ අවස්ථාවේ දී සළකා බැලිය යුතු වන්නේ ප්‍රථමයෙන් ඉල්ලා ඇති සහන හතර සම්බන්ධයෙන් පමණකි. ඒ අනුව මෙම අභියාචනය සම්බන්ධයෙන් සළකා බැලිය යුතු වන්නේ, අභියාචක වරදකරු කරමින් විනය පරීක්ෂණය පැවැත්වූ අය විසින් ගනු ලැබූ තීරණයන් ඉවත් කළ යුතුද යන කරුණ සහ එකී තීරණය අනුව නිකුත් කර ඇති දඬුවම ඉවත් කළ යුතුද යන කරුණයි.

2020.10.28 දිනැති චෝදනා පත්‍රයෙන් ඉදිරිපත් කර තිබූ චෝදනා 06ට අභියාචක වරදකරු වන බව පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ නිලධාරියා විසින් තීරණය කර ඇත. එම චෝදනා පහත දැක්වේ.

I. **ඔබ, දොර දෙකේ LG ශීතකරණයක් හා/හෝ මයික්‍රෝවේව් අවන් (Microwave Oven) 01 ක් හා/හෝ රයිස් කුකර් (Rice Cooker) 02ක් හා/හෝ බන්ධනාගාරය තුළට ගැනීමට, “ගබඩාවේ අධිකාරී අනුමැතිය” ලේඛනයට අනුමැතිය ලබාදීම මගින් බන්ධනාගාර ආඥාපනතේ 59 වන වගන්තිය හා බන්ධනාගාර ආඥාපනත යටතේ පනවා ඇති උපකාරක නීතින්හි (වරදකරුවන් නොවූ සිරකරුවන් හා සිවිල් සිරකරුවන් අදාළ රීති) 190 වගන්තියේ විධිවිධානයන් ඔබ විසින් හිතාමතා හෝ අනවධානයෙන්**

**හෝ නොසළකා හැරීම හෝ මගහැරී යන ආකාරයෙන් කටයුතු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛණයේ 9 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.**

**II.** **ඔබ, රුපියල් විසිපන්දහසකට (රු.25,000.00) වඩා වැඩි වටිනාකමක් සහිත ශීතකරණයක් හා/හෝ මයිකෝවේව් අවන් එකක් ඇතුළු විදුලි භාණ්ඩ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියකින් තොරව ලබා ගැනීමට කටයුතු කිරීම මගින් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 32/2008 හි හා/හෝ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2020 හි ඇතුළත් විධිවිධානයන් උල්ලංඝනය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසළකා හැරීම හෝ මග හැරී යන ආකාරයෙන් කටයුතු කර ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදුකිරීම.**

**III.** **ඔබ, අධිකාරී නියෝග 09/2020 මගින් "L" විශේෂ සිර මැදිරියේ රැඳවියන් සඳහා ශීතකරණයක්, විදුලි උදුනක්, රයිස් කුකරයක්, යන භාණ්ඩවලින් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ නිකුත් කිරීමෙන් බන්ධනාගාර ආඥාපනතේ 59 වන වගන්තිය හා බන්ධනාගාර ආඥාපනත යටතේ පනවා ඇති උපකාරක නීතින්හි (වරදකරුවන් නොවූ සිරකරුවන් සහ සිවිල් සිරකරුවන්ට අදාළ රීති) 190 වගන්තියේ විධිවිධානයන් හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මග හැරී යන ආකාරයෙන් කටයුතු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකල හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 9 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.**

**IV.** **ඔබ, අධිකාරී නියෝග 09/2020 මගින් "L" විශේෂ සිර මැදිරියේ රැඳවියන් සඳහා ශීතකරණයක්, විදුලි උදුනක්, රයිස් කුකරයක්, යන භාණ්ඩවලින් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ නිකුත් කිරීමෙන් බන්ධනාගාර ආඥාපනත යටතේ පනවා ඇති උපකාරක නීතින්හි (තහනම් භාණ්ඩ පිළිබඳ රීති) 236 වගන්තියේ විධිවිධානයන් ඔබ විසින් හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මගහැරී යන ආකාරයෙන් කටයුතු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය**

**නිලධරයන් විසින් සිදුකල හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 9 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.**

V. **ඔබ, පහත සඳහන් ලැයිස්තු අංක 01 හි නම සඳහන් සැකකරුවෙකුට හෝ දෙදෙනෙකුට හෝ සියල්ලටම ලැයිස්තු අංක 02 හි සඳහන් භාණ්ඩයක් හෝ කිහිපයක් හෝ සියල්ලම ලබාදීමට සැකකරුවන්ගේ ඉල්ලීම් ලේඛනයට අනුමැතිය ලබාදීම මගින් බන්ධනාගාර ආඥා පනතේ 59 වන වගන්තිය හා බන්ධනාගාර ආඥා පනත යටතේ පනවා ඇති උපකාරක නීතීන් හි (වරදකරුවන් නොවූ සිරකරුවන් හා සිවිල් සිරකරුවන්ට අදාළ රීති) 190 වගන්තියේ විධිවිධානයන් ඔබ විසින් හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මගහැරී යන ආකාරයෙන් කටයුතු කර ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛණයේ 9 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.**

| ලැයිස්තු අංක 1 | |
|---|---|
| **සැක අංකය** | **සැකකරුගේ නම** |
| **2720** | **එම්.අමාන් ශේක්** |
| **8785** | **ඉන්දික ප්‍රියශාන්ත** |
| **2950** | **එම්.ඒ.කේ.මොහොමඩ් මුජාහිඩ්** |

| ලැයිස්තු අංක 02 |
|---|
| **භාණ්ඩ** |
| **විදුලි කේතලයක්** |
| **විදුලි උදුනක්** |
| **රයිස් කුකරයක්** |
| **ශීතකරණයක්** |

VI **ඔබ, ඉහත I සිට V දක්වා චෝදනාවල සඳහන් වැරදි එකක් හෝ කිහිපයක් හෝ සියල්ල සිදුකර රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීමෙන් ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිද කළ හැකි වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 10 වගන්තිය යටතට ගැනෙන වරදක් සිදු කිරීම.**"

ඉහත චෝදනා දෙස බැලීමේ දී පෙනී යන්නේ, එම චෝදනාවන්ට පදනම්ව ඇත්තේ, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ අනුමැතියකින් තොරව, අභියාචකගේ පාලනය යටතේ පැවති බන්ධනාගාරය තුළට, එල්.ජී වර්ගයේ දොර දෙකේ ශීතකරණයක් හා/හෝ මයිකෝවේව් අවන් එකක්, විදුලි කේතලයක්, සහ

රයිස් කුකර් දෙකක්, ඇතුළු විදුලි භාණ්ඩ, රැගෙන ඒමට අනුමැතිය ලබාදී, ඒවා බන්ධනාගාරය තුළට ගෙන ඒමට පහසුකම් සළසාදී තිබීමයි. එම කරුණ හේතුවෙන් අභියාචක ආයතන සංග්‍රහයේ දෙවන වෙළුමේ XLVIII පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ වරදවල් සම්බන්ධ පළමු උපලේඛනයේ 15 වගන්තියේ 15:9 සහ 15:10 යන උප වගන්ති යටතට ගැනෙන වරදක් සිදුකරන ලද බවට ඉහත චෝදනා ඉදිරිපත් කර තිබුණි. එහි තවදුරටත් සඳහන් වන්නේ, ඉහත කී භාණ්ඩ බන්ධනාගාරය තුළට රැගෙන එම සඳහා අනුමැතිය ලබා දීමෙන් බන්ධනාගාර ආඥා පනතේ 59 වගන්තිය සහ ඒ යටතේ බන්ධනාගාර ආඥා පනත යටතේ පනවා ඇති උපකාරක රීති 190, 236, සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛ 32/2008 හා/හෝ 01/2020 දරණ විධිවිධාන කඩකර හෝ මඟ හැරී යන ආකාරයට අභියාචක කටයුතු කර ඇති බවයි.

එසේ නම් මෙහිදී ප්‍රථමයෙන් සළකා බැලිය යුතු වන්නේ, විධිමත් විනය පරීක්ෂණය අවසානයේදී ගනු ලැබූ තීරණය සහ එයට අදාළව දඩුවම් පැමිණවීමේ දී, විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා සහ විනය බලධාරියා විසින් පිළිගත් නීති රීති අනුගමනය කරමින් සහ විනය පරීක්ෂණයේ දී චූදිතයෙකු සතු අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි කටයුතු කරමින් එකී තීරණයන්ට එළඹ තිබේද යන්නයි. ඒ අනුව මෙහිදී සළකා බැලිය යුතු වන්නේ, සිර මැදිරිය තුළට ගෙන එන ලද භාණ්ඩ අභියාචකගේ පාලනය යටතේ පැවති බන්ධනාගාරය තුළට රැගෙන ඒම නිත්‍යානුකූලවේද යන කරුණ සහ එසේ රැගෙනවිත් තිබේ නම්, ඒ හේතුවෙන් අභියාචක විසින් අදාළ නීති රීති කඩකර තිබේද යන්නයි.

චානක කුෂාන් වීරසිංහ යන සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා සිටියේ ඔහු 2020.05.11 වෙනි දින, සහකාර බන්ධනාගාර කොමසාරිස් ප්‍රසාද් ප්‍රේමතිලක මහතා සහ ප්‍රධාන ජේලර් ප්‍රදීප් වසන්ත යන අය සමඟ පෙ.ව.10.00 පමණ, මිගමුව බන්ධනාගාරයේ L විශේෂ අංශයට පැමිණි බවයි. එම සිර කුටියේ අංක 2 සිර මැදිරිය ඔවුන් විසින් පරීක්ෂා කිරීමේ දී, මයික්‍රෝවේව් විදුලි උදුනක්, මෙට්ටයක්, විදුලි කේතලයක්, බටර්, චීස්, සෝස්, පිටි වර්ග රාශියක්, එතුළ දක්නට තිබුණ බවටද ඔහු ප්‍රකාශ කර ඇත. ඔවුන් විසින් එම භාණ්ඩ ඡායාරූපගත කරන ලද බවට ද ඔහු පවසා ඇත. ඉන් අනතුරුව අංක 7 සිර මැදිරිය ඔවුන් විසින් පරීක්ෂා කිරීමේ දී, අඩි 4ක් පමණ උස අළු පැහැති අබාන්ස් වර්ගයේ දොර දෙකේ ශීතකරණයක්, අයිස් පෙට්ටියක්, උණු වතුර බෝතලයක් එහි තිබූ බවත්, ශීතකරණය තුළ චොකලට්, චීස්, බටර්, කෝඩියල් බෝතල්, අයිස් වතුර, පළතුරු,

කොකා කෝලා බෝතල් අසුරා තිබුණ බවටත් ඔහු විසින් ප්‍රකාශ කර ඇත. එම භාණ්ඩ ද ජායාරූප ගත කළ බවටද තවදුරටත් ඔහු ප්‍රකාශ කර ඇත. අංක 11 සිර මැදිරියේ මීට අමතරව අඩි 04ක් පමණ උස කබඩ් 01ක්, ජාතික කොඩියක්, බෞද්ධ කොඩියක් තිබුණ බවටත් ඔහු ප්‍රකාශ කර ඇත. ඉහත කී භාණ්ඩ ඒ ආකාරයෙන් තිබුණ බව චන්ද්‍රසේකර නැමැති සාක්ෂිකරු ද පැහැදිලිව පවසා ඇත. මෙම තත්ත්වය නිශාන්ත සේනාරත්න නැමැති සාක්ෂිකරුගේ සාක්ෂියෙන් ද තහවුරු වී ඇත. එම භාණ්ඩ ඉහත කී සිර මැදිරි තුළ තිබූ බව අභියාචක විසින් ද පිළිගෙන ඇත. ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර ඇත්තේ එම භාණ්ඩ පරිත්‍යාගයන් ලෙස ලැබුණ බවයි. අභියාචක මේ සම්බන්ධයෙන් ලබා දී ඇති සාක්ෂිය පහත සඳහන් වේ.

> " **ඒ අවස්ථාවේ මම ඒ මහතාට කියා සිටියේ සැකකරුවන්ගේ ඉල්ලීම අනුව බන්ධනාගාර ආඥා පනතේ නීති ප්‍රතිපාදන අනුව, මේ කාලය කොවිඩ් කාල සීමාවක් බැවින්, කොවිඩ් කාල සීමාව අවසන් වනතෙක් පමණක් මෙම රැඳවියන්ට අදාළ භාණ්ඩ නිකුත් කළ බවයි**".

ඉහත සාක්ෂි වලින් පැහැදිලිව පෙනී යන්නේ මයික්‍රෝවේව් විදුලි උදුනක්, මෙට්ටයක්, විදුලි කේතලයක්, වැනි විදුලි භාණ්ඩ ඇතුළු භාණ්ඩ අභියාචකගේ අනුමැතිය හා අනුදැනුම මත බන්ධනාගාරය තුළට රැගෙනවිත් තිබෙන බවයි.

මෙම තත්ත්වය යටතේ ඊළගට තීරණය කළ යුතු වන්නේ, ඉහත සඳහන් භාණ්ඩ සිරකරුවන්ගේ පරිහරණය සඳහා බන්ධනාගාර පනතේ විධිවිධාන වලට හා ඒ අනුව ප්‍රකාශයට පත් කරන ලද රීතීන්ට අනුකූලව ලබා දී තිබේද යන්නයි. එය අභියාචක විසින් ඉදිරිපත් කර ඇති විත්ති වාචකයයි.

චෝදනා ඉදිරිපත් කිරීම සඳහා පදනම් කර ගෙන ඇත්තේ බන්ධනාගාර ආඥා පනතේ 59 වන වගන්තිය හා ඒ අනුව නිකුත් කර ඇති උපකාරක රීතින් කඩකර තිබේද යන කරුණයි. ඉහත කී 59 වන වගන්තිය පහත දැක්වේ.

> "**සිවිල් වරදකරුවකුට තමන් නඩත්තු කර ගැනීම සඳහා අවසරයද, ආහාර, ඇඳුම්, නිදා ගැනීමට අවශ්‍ය දෑ සහ වෙනත් අවශ්‍ය දේවල් සුදුසු කාල වේලාවකදී තම මුදලින් මිලදී ගැනීම හෝ පුද්ගලික මූලාශවලින් ලබා ගැනීමට අවසරය ලබා දෙන නමුත්, පරීක්‍ෂා කිරීමකට හෝ කොමසාරිස්වරයා විසින් අනුමත කල කොන්දේසිවලටද යටත් විය යුතුය.**"

ඊට අමතරව බන්ධනාගාර රීති 190 වගන්තිය ද කඩකර ඇති බවට චෝදනා පත්‍රයේ සඳහන් කර ඇත. එකී 190 වගන්තිය පහත දැක්වේ.

**"සෑම සිවිල් සිරකරුවෙකුටම බන්ධනාගාර ආඥා පනතේ 59 වගන්තිය යටතේ ආහාර, ඇඳුම් හා නිදා ගැනිමට අවශ්‍ය දේ සහ අනෙකුත් උපකරණ සම්බන්ධයෙන් ලබා දී ඇති හිමිකම (සිවිල් සිරකරුවෙකුට තම නඩත්තුව සඳහා ආහාර, ඇඳුම්, නිදා ගැනීමට අවශ්‍ය දෑ සහ වෙනත් අවශ්‍ය දේවල් සුදුසු කල වේලාවකදී මිලදී ගැනීම හෝ පුද්ගලික මූලාශ්‍ර වලින් ලබා ගැනීමේ අවසරය) සෑම වරදකරුවෙකු නොවන සිරකරුවෙකු වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට බන්ධනාගාර අධිකාරීවරයාට අවසරය ඇති අතර, සෑම සිවිල් සිරකරුවෙකුටම කොමසාරිස්වරයා විසින් අදාළ තත්ත්වයන් යටතේ අනුමැතිය ලබාදිය හැකි අතර එම ආඥා පනතේ 60 වගන්තිය යටතේ සීමා පැනවිය හැක."**

මීට අමතරව බන්ධනාගාර චක්‍රලේඛ 32/2008, 1/2020 දරණ චක්‍රලේඛ උල්ලංඝණය කර ඇති බවටත් දක්වමින් අභියාචක වෙත චෝදනා ඉදිරිපත් කර ඇත.

තවද, අංක 4 දරණ චෝදනාව මගින් චෝදනා කර ඇත්තේ බන්ධනාගාර රීති 236 ද අභියාචක විසින් කඩකර ඇති බවයි. එකී රීති 236 පහත දැක්වේ.

**"236. All articles not supplied by the prison regulations and according to prison rules shall be deemed to be prohibited articles. Any such article which may be found in the possession of a prisoner, or any money, clothing, food, drink, tobacco, letter paper, book, tool or other article whatsoever which may, without the sanction of the Superintendent: - Tobacco, betel, spirits or introduced into the prison in order that such article may come into the possession of any prisoner, may be confiscated by the Superintendent."**

අභියාචක වෙනුවෙන් මෙම විනිශ්චය අධිකාරය වෙත අවසාන වශයෙන් 2025.02.24 වෙනි දින ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන වල සඳහන් කර ඇත්තේ, බන්ධනාගාර සිර මැදිරිය තුළ තිබූ ඉහත සඳහන් භාණ්ඩ සිර මැදිරි තුළට ලබා දීම සඳහා ඔහු විසින් කටයුතු කර ඇත්තේ, අංක 09/2020 හා 2020.05.20 දිනැතිව නිකුත් කරන ලද අධිකාරී නියමයන්ට අනුව බවයි. එවැනි නියමයන් ඔහු විසින් නිකුත් කිරීමට පදනම් කරගෙන ඇත්තේ බන්ධනාගාර කොමසාරිස් විසින් 2020.03.29 දිනැතිව හා 2020.04.03 දිනැතිව නිකුත් කර ඇති

චක්‍රලේඛයන්හි සඳහන් උපදෙස් අනුව බවද ඔහුගේ දේශනවල සඳහන්ව ඇත. මීට අමතරව අභියාචක විසින් කරුණු දක්වා ඇත්තේ, මෙම භාණ්ඩ ත්‍යාගයක් වශයෙන් ලැබී ඇති බවත්, එවැනි ත්‍යාග කොවිඩ් 19 වසංගතය පැවති කාල පරිච්ඡේදය තුළදී භාරගැනීමට අවසර ලබා දී තිබූ බවත්ය. එකී අවසරය ලබා දී ඇත්තේ සහකාර බන්ධනාගාර අධිකාරී විසින් නිකුත් කරන ලද, 2020.05.20 දිනැති උපදෙස් අනුව බවට ද අභියාචක කරුණු දක්වා ඇත.

මෙහිදී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වන්නේ, ඉහත කී අවසරය මත සිර මැදිරි තුළට භාණ්ඩ ගෙන ඒමට අවසරය ලබා දී ඇත්තේ කුඩා ශීතකරණයක්, බත්පිසින උඳුනක් සඳහා පමණක් බවයි. මෙම භාණ්ඩ රැගෙන ඒමට අවසර ලබා දී ඇත්තේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් වන අතර, මේ අවස්ථාවේ දි ඒවා එම කාර්ය සඳහා ම භාවිතා කළාද යන්න තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් වි නැත. තවද, ඉදිරිපත් වී ඇති සාක්ෂි අනුව මෙම ස්ථානයේ චොකලට්, පැනිබීම බෝතල්, බටර්, චීස්, යනාදි භාණ්ඩ තිබී ඇති අතර, කොවිඩ් වසංගතය වැළැක්වීම සඳහා එවැනි භාණ්ඩ අවශ්‍ය වන්නේ නැත. තවද ඉන්සියුලින් නැමැති ඖෂධය එහි තිබූ බවට හෝ කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

ඒ අනුව පෙනී යන්නේ, ඉහත කි සහකාර බන්ධනාගාර කොමසාරිස්වරයා විසින් සිරමැදිරි තුළට ගෙන ඒම සඳහා අනුමැතිය ලබා දි ඇති භාණ්ඩ වලට අමතරව, වෙනත් සුඛෝපභෝගී භාණ්ඩද සිරමැදිරි තුළ තිබී ඇති බවට පැහැදිලිව සාක්ෂි ඉදිරිපත් වී ඇති බවයි. ඒ අනුව සිරමැදිරි තුළ තිබූ ඉහත සඳහන් භාණ්ඩ, ඉහත කී සහකාර බන්ධනාගාර කොමසාරිස්ගේ උපදෙස් මත බන්ධනාගාරය තුළට රැගෙන ආ භණ්ඩ බවට ඉදිරිපත් කරනු ලබන විත්ති වාචකය පිළිගත නොහැක.

මෙම කාල වකවානුව තුළ කොවිඩ් වසංගතය පැවති බව විවාදයකින් තොරව පිළිගෙන ඇත. එසේ නම්, එම වසංගතය පැවැති කාල පරිච්ඡේදය තුළ ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් නිකුත් කර තිබූ උපදෙස් මත පිහිටා අභියාචක කටයුතු කර තිබේදැයි විමසා බැලිය යුතුය. බන්ධනාගාර කොමසාරිස් ජනරාල්ගේ 2020.03.14 දිනැති ලිපිය මගින් බන්ධනාගාර අභ්‍යන්තරයට වෛරසය පිවිසීම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හා ඒ මගින් පිරිසිදුකම පවත්වා ගෙන යාම පදනම් කරගෙන රැදවියන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පෙන්වා දී ඇත. ඉන් අනතුරුව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ 2020.03.29 වෙනි දිනැති ලිපිය මගින් ද උපදෙස් දී ඇත්තේ, රැදවියන්ගේ

සනීපාරක්ෂාව සඳහා අවශ්‍ය භාණ්ඩ පරිහරණය කිරීමේ දී ගතයුතු ක්‍රියා මාර්ග මොනවාද යන්නයි.

මේ අවස්ථාවේ දී, 2020.04.03 දිනැතිව බන්ධනාගාර කොමසාරිස් (බුද්ධි) යන අය නිකුත් කර තිබූ උපදෙස් වලට ද මාගේ අවධානය යොමු කරන ලදි. එහි සඳහන් වන්නේ, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් ලබාදෙන ලද ආරක්ෂක ක්‍රම වේදයන්ට අනුව නිලධාරීන් විසින් ක්‍රියා කළ යුතුව තිබූ බවයි. එකී උපදෙස් වලට අනුව, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ නියෝග මත කටයුතු කිරීමේදී වුවද, ඉහත සඳහන් උපදෙස් වලට පටහැනිව යමින්, යම් යම් භාණ්ඩ සිරකරුවන්ගේ පරිහරණය සඳහා ලබා දීමට හැකියාව ලැබෙන්නේ නැත. එසේ නම් ඒ මත කටයුතු කරමින්, විවිධ උපදෙස් ලබා දීමට හෝ වෙනත් නියමයන් නිකුත් කිරීමට බන්ධනාගාර අධිකාරිවරයා වන අභියාචකට අවසර ලැබෙන්නේ නැත.

අභියාචක වෙනුවෙන් කරුණු දක්වමින් පවසා ඇත්තේ, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ නියමයන් අනුව යමින් ඔහු විසින් නිකුත් කරන ලද අධිකාරී නියෝගයන් වන, 09/2020 හා 2020.05.07 දිනැති උපදෙස් වලට අනුකූලව මෙම භාණ්ඩ රැඳවියන්ගේ පරිහරණය සඳහා ලබා දී ඇති බවයි.

ඉහත කී අධිකාරී නියෝග 09/2020 මගින් නිකුත් කරන ලද උපදෙස් දී ඇති ලේඛනයේ සඳහන් උපදෙස් නිකුත් කර ඇති දිනය මෙහිදි වැදගත් කරුණක් වනවා ඇත. එම ලේඛනයේ සඳහන් උපදෙස් නිකුත් කර ඇත්තේ, 2020.05.07 දින බවට සඳහන් කරමින්, අභියාචක විසින් ඔහුගේ අත්සන තබා ඇත. මෙම සිද්ධියට අදාළ මූලික විමර්ශනය, බන්ධනාගාර අධිකාරී ප්‍රසාදි ප්‍රේමතිලක මහතා ඇතුළු කණ්ඩායමක් විසින් මීගමුව බන්ධනාගාරය වෙත ගොස් පවත්වා ඇත්තේ 2020.05.11 වෙනි දින දීය.

පැ.55 ලෙස ලකුණු කර ඇති 2020.05.02 දින දරණ ලිපිය අනුව අප්පුහාමි නැමැති පුද්ගලයෙකු විසින් නේවාසිකයන්ගේ බෙහෙත් වර්ග සුරක්ෂිතව තබා ගැනීම සඳහා කුඩා වර්ගයේ සිසිල් වර්ගයේ ශීතකරණයක්, මයික්‍රෝවේව් උදුනක්, සහ විදුලි උදුනක් ත්‍යාගයක් ලෙස ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. පැ.50 වශයෙන් ලකුණු කර ඇත්තේ, බන්ධනාගාරය තුළට රැගෙන එන භාණ්ඩ ඇතුළත් ලේඛනයයි. එම ලේඛනය ඇතුළත් සාක්ෂි සළකා බැලීමෙන් අනතුරුව පෙනී ගියේ, එහි සඳහන් 2020.05.11 දිනැති, අයිතම අංක 05(02) යටතේ සඳහන් වන්නේ, අප්පුහාමි යන අය විසින් තෑගි ලබාදීම සඳහා කරන ලද ඉල්ලීම කර ඇත්තේ 2020.05.01 සහ 2020.05.11 යන දිනයන් හීදී බවයි. ඒ අනුව පෙනී යන්නේ මෙම ප්‍රශ්නගත

භාණ්ඩ 2020.05.11 වෙනි දින ලැබී තිබුණත්, එම භාණ්ඩ ලබා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත්තේ 2020.05.01 වෙනි දින බවයි.

මෙම කාල පරිච්ඡේදය වන විට, කෝවිඩ් වසංගතය සම්බන්ධයෙන් බලපැවැත්වූ, 9/2020 නියෝගය නිකුත් කර තිබී නැත. එය නිකුත් කර ඇත්තේ 2020.05.07 වෙනි දින දිය. අප්පුහාමි යන අය විසින් ඉල්ලීම කර ඇත්තේ 2020.05.01 දින දීය. එසේ නම් මෙම භාණ්ඩ බන්ධනාගාරය තුලට ගෙන ඒම සඳහා අභියාචක විසින් පෙර සූදානමකින් සිටි බවක් ද පෙනී යයි. තවද ඉහත කී අංක 09/2020 දරණ නියෝගය යටතේ මෙම ක්‍රියාවලිය ආරම්භ වූ පසුව, අභියාචක විසින්ම අදාළ නියෝග නිකුත් කර තිබීම නිසා, ඔහුගේ නිර්දෝෂිභාවය තවදුරටත් අභියෝගයට ලක්වේ. එම කාර්ය සඳහා උසස් නිලධාරීන් දැනුවත් කිරීමක් හෝ කර නැත.

බන්ධනාගාර පනතේ 59 වගන්තිය අනුව, කිසියම් භාණ්ඩ සිරකරුවන්ගේ පාවිච්චියට ලබාදීමේ දි, බන්ධනාගාර කොමසාරිස්ගේ අනුමැතිය අවශ්‍ය බව පැහැදිලි ව සඳහන් කර ඇත. ප්‍රශ්නගත භාණ්ඩ ලබාගැනීම සඳහා බන්ධනාගාර කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව, අභියාචකගේ අභිමතය පරිදි බන්ධනාගාරය තුළට රැගෙනවිත් ඇති බව පැහැදිලිය. ඒ අනුව, අභියාචක විසින් බන්ධනාගාර පනතේ 59 වගන්තිය යටතේ දැක්වෙන ආකාරයට කටයුතු නොකර සිටිමින්, එකී වගන්තිය උල්ලංඝණය කරමින් කටයුතු කර ඇති බව බැලූ බැල්මටම පෙනී යයි.

ඉදිරිපත් කර ඇති චෝදනා වල, ඉහත කී බන්ධනාගාර ආඥා පනතේ 59 වගන්තිය යටතේ හා ඒ යටතේ නියම කරන ලද 190 වගන්තිය යටතේ වන රෙගුලාසි කඩකර ඇති බවට ද සඳහන් වේ. 190 රෙගුලාසියේ ද සඳහන් වන්නේ, ආහාරපාන, ඇඳුම්, ඇඳ ඇතිරිලි ආදි, අවශ්‍ය වන භාණ්ඩ පරිහරණයට ලබා ගැනීම සඳහා බන්ධනාගාර කොමසාරිස්ගේ අනුමැතිය අවශ්‍ය බවයි. ඉහතින් සඳහන් කළ පරිදි, එවැනි අවසරයක් මෙහිදී ලබාගෙන නැත.

අභියාචක වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන වල සඳහන් කර ඇත්තේ ඔහු විසින් නියම කර ඇති අධිකාරී නියෝග අංක 2020/09 දරණ නියෝග නිකුත් කිරීමට බන්ධනාගාර රීති 196 වගන්තිය යටතේ ඔහුට බලය ඇති බවයි. එකී 196 උප වගන්තිය පහත දැක්වේ.

196. (1) On the payment of a fee fixed by the Superintendent, any unconvicted prisoner or civil prisoner may be permitted by the Superintendent to be placed in exclusive occupation of a room or cell is better equipped than an ordinary

cell or ward, if such a room or cell is available and the status and condition of such prisoner warrant the provision of such accommodation.

(2) With the permission of the Superintended, any unconvicted prisoner or civil prisoner who has been placed in exclusive occupation of a room or cell under paragraph (1) may procure at his expense such furniture and other equipment for that room or cell as may be approved by the Superintendent.

එකී රෙගුලාසි අනුව බන්ධනාගාර අධිකාරීවරයෙකුට බලය ලැබී ඇත්තේ කිසියම් සිර මැදිරියකට අවශ්‍ය වන ඇඳ ඇතිරිලි, වැනි ගෘහ භාණ්ඩ ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට පමණි. මෙම තත්ත්වය රීතීන්හි 196(2) වගන්තියෙන්ද පැහැදිලිවේ.

එම වගන්තියන් දෙස බැලු විටද පෙනී යන්නේ, කිසියම් සිර මැදිරියක් තුළ සිරකරුවන්ට නිදා ගැනීම වැනි කටයුතු සඳහා අවශ්‍ය වන භාණ්ඩ සපුරාදීමට බන්ධනාගාර අධිකාරීවරයාට ඇති බලතලයි. ඒ මගින් චොකලට්, චීස්, බටර්, කෝඩියල් බෝතල්, අයිස් වතුර, පළතුරු, කොකා කෝලා බෝතල් වැනි සුඛෝපභෝගී භාණ්ඩ, දඩුවමට ලක් නොවු සිරකරුවන්ට ලබා දීමට බන්ධනාගාර අධිකාරීවරයාට අභිමතයක් ලැබෙන්නේ නැත. ඒ අනුව මෙහිදී, අභියාචක විසින් රෙගුලාසි 190 හා 196 වගන්තීන් යටතේ කටයුතු කර ඇතැයි කියනු ලබන ක්‍රියාවන්, එම වගන්ති වලට ඇතුළත් බලසීමාවන් තුළට නොවැටෙන බව පැහැදිලිව පෙනී යයි.

ඉහතින් සඳහන් කරන ලද කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ අභියාචකගේ අනුදැනුම මත බන්ධනාගාර රෙගුලාසි හා උපදෙස් වලට පටහැනිව, ප්‍රශ්නගත ශීතකරණය සහ විදුලි උපකරණ ඇතුලු විවිධ භාණ්ඩ සිර මැදිරිය තුළට ගෙන යෑමට අභියාචක අවසර දී ඇති බවයි. එකී භාණ්ඩ බන්ධනාගාරය තුළට ගෙන ඒම සඳහා අවසරයක් ලබා දීමට බන්ධනාගාර පනතින් හෝ එම පනත යටතේ සාදන ලද රීති අනුව අභියාචකට බලය ලැබී නැති බවටද පැහැදිලිව පෙනී යයි. එබැවින් අභියාචකට එරෙහිව එල්ල වී ඇති ප්‍රධාන චෝදනා පැහැදිලිව ඔප්පු වී ඇති බව පෙනී යයි.

ඉහතින් දක්වන ලද කරුණු අනුව පෙනී යන්නේ, අභියාචක ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධරීන් විසින් සිද කළ හැකි වරදවල්

සම්බන්ධ පළමු උපලේඛනයේ 9, 10 සහ 15 වගන්ති යටතට ගැනෙන වරදවල් සිදුකර ඇති බවයි.

තවද ඉහත කරුණු අනුව, විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව, එම පරීක්ෂණයේ ප්‍රතිඵල මත අභියාචක වරදකරු කරමින් විනය පරීක්ෂණය පැවැත්වූ නිලධාරියා විසින් අභියාචකට එරෙහිව ලබා දී ඇති විනය නියෝගය නිවැරදි සහ විධිමත් බවද පෙනී යයි. ඒ අනුව ඒ සම්බන්ධයෙන් මැදිහත්ව කටයුතු කිරීමක් සිදු නොකළ යුතු බවට තවදුරටත් තීරණය කරමු.

ඉහත කරුණු සළකා බලා අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනය ප්‍රතික්ෂේප කරමු.

අභියාචක විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත දේශන සමග ඔහුගේ පූර්ව සේවා කාලය තුළ කරන ලද ප්‍රසංශාත්මක ක්‍රියාවන් පිළිබඳව දීර්ඝ වාර්තාවක් ඉදිරිපත් කර ඇත. අභියාචකගේ පෙර සේවා කාලය යහපත් වුවද, ඔහු වරදකරු වී ඇති චෝදනා සම්බන්ධයෙන් සළකා බලන විට, එකී යහපත් ක්‍රියා කලාපයන් මෙහිදි සැළකිල්ලට භාජනය කළහොත් ඒ තුළින්, බන්ධනාගාර අධිකාරිවරයකු ලෙස අභියාචක විසින් ගනු ලැබ ඇති ක්‍රියා කලාපය අනුමත කළා විය හැක. එබැවින් මේ අවස්ථාවේ දි අභියාචකගේ පෙර යහපත් කල් ක්‍රියාවන් නොසළකා හැරීමට තීරණය කරමු.

ඉහත හේතූන් සළකා බලා, අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කර ඇති අභියාචනය නිෂ්ප්‍රභ කරමු.

අභියාචනය නිෂ්ප්‍රභ කිරීමට තීරණය කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

ලලිතා/-